# තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

මෙම ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය "අ" ඛණ්ඩය

**අවශ්‍ය සුදුසුකම් :**

01. ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ ඊට සමාන සුදුසුකම් හෝ

02. ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව හෝ

03. අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව වන උසස් ජාතික ඩිප්ලෝමාව හෝ

04. අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් ආයතනයක් මගින් පිරිනමනු ලබන, අවම වශයෙන් වසර දෙකක (02) පූර්ණ කාලීන ඩිප්ලෝමාව සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) පළපුරුද්ද.

**සටහන** : බඳවා ගැනීම සිදුකළ යුතු ක්ෂේත්‍රයන් වනුයේ සිවිල් ඉංජිනේරු තාක්ෂණ, විදුලි ඉංජිනේරු තාක්ෂණ, විද්‍යුත් ඉංජිනේරු තාක්ෂණ, බහුඅවයවික ඉංජිනේරු තාක්ෂණ, රසායන ඉංජිනේරු තාක්ෂණ, පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ හා යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණ බැවින් ඒ ක්ෂේත්‍ර වලට අදාළ සුදුසුකම් සපුරා තිබීම අවශ්‍යවේ.

**වැටුප් පරිමාණය** : රු. 35,145 - 7X355, 9X495 - 42,085 [U-MT 1(II)] මාසික

**බඳවා ගනු ලබන ආකාරය** : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි

## 02. තාක්ෂණික නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම්:**

01. අ.පො.ස (උ/පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවේ එකවර විද්‍යා විෂයයන් 03ක් සමත්ව තිබීම සහ

02. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ තොරතුරු හා සන්නිවේදනය සහ බහු මාධ්‍ය තාක්ෂණය /තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය /තොරතුරු තාක්ෂණය හෝ සමාන ක්ෂේත්‍රයන් පිළිබඳ පිළිගත් ආයතනයකින් පිරිනමන ලද NVQ Level 5ට නො අඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**සටහන** : තොරතුරු හා සන්නිවේදනය තාක්ෂණය පිළිබඳ පළපුරුද්දක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් පරිමාණය** : රු. 31,025- 7X300, 10X 355 - 37,275 [U-MT 1(IIIA)] මාසික

**බඳවා ගනු ලබන ආකාරය** : ලිඛිත සහ/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි

**සටහන** :i. මෙම තනතුරු සඳහා මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව රු.7,800/-, අතිරේක මාසික දීමනාව (20%) හා මාසික අන්තර් දීමනාව (45%)ද ගෙවනු ලැබේ.

ii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

තමාගේ නම සහ ලිපිනය ලියන ලද සෙ.මී. 23 X 10 ප්‍රමාණයේ මුද්දර සහිත කවරයක් 2020.11.05 දිනට පෙර නියෝජ්‍ය ලේඛකාධිකාරී, තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, දියගම, හෝමාගම වෙත එවීමෙන් හෝ තාක්ෂණික ආයතනය වෙත පැමිණ අයදුම්පත් ලබා ගත හැකිය. තාක්ෂණික ආයතනය විසින් නිකුත් කරනු ලබන අයදුම්පත් හෝ එම ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් පමණක් භාරගනු ලැබේ. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2020.11.20 වේ. නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමඟ අදාළ සහතිකවල ඡායා පිටපත් ද අමුණා එවිය යුතුය. එම ඡායා පිටපත් මුල් සහතිකයේ සැබෑ පිටපත් බවට අයදුම්කරු විසින් සටහන් යොදා ස්වකීය අත්සන මගින් එම සටහන සහතික කළ යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, සහතිකවල පිටපත් අමුණා නොතිබීම, ස්වකීය අත්සන යොදා සහතික නොකිරීම, අදාළ ආකෘතියට අනුකූල නොවීම, අපැහැදිලි බව හෝ වෙනත් අවශ්‍යතාවයන් සපුරා නොතිබීම, අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ. අයදුම්පත් සහ විස්තර http://www.itum.mrt.ac.lk වෙතින් ද ලබා ගත හැක.

**නිසි බලධාරී, තාක්ෂණික ආයතනය,**
**මොරටුව විශ්වවිද්‍යාලය, දියගම, හෝමාගම.**
2020-10-25